**වර්ෂ 2023 ක් වූ මාර්තු මස 13 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 02. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 05. ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 06. ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 07. ගරු මන්ත්‍රී | - | කේ.ඕ සෝමතිලක මහතා |
| 08. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 09. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |
| 10. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 11. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 12. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |
| 13. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 14. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 15. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |
| 16. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |
| 17. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 18. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |
| 02. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම**

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා

ගිය සභාවෙ මම කිව්වා 2022 යෝජනා සම්බන්ධයෙන්. ඒක මේ වාර්තාවේ ඇතුළත් වෙලා නෑ. ඔබතුමා උත්තරයකුත් දුන්නා. 2022 යෝජනා ක්‍රියාත්මක කරන්න බැරි වුනා TO මහත්තයාගේ ප්‍රශ්නේ නිසා කියලා ඒක ඇතුළත් වෙලා නෑ

ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය

මගෙත් ගිවිසුම් අත්සන් කරලා යවලා නෑ කියන එක කිව්වා. ඒකත් ඇතුළත් වෙලා නෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අපිට ගිවිසුම් අත්සන් කරලා තියනවානම් ක්‍රියාත්මක කරන්න හැකියාව තියනවා.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා හා ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන සහිතව 2023 පෙබරවාරි මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2023 පෙබරවාරි මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, පස්බාගේ කෝරළේ, නාවලපිටිය

දෙකිඳ හොරේහින්න සුසාන භූමිය පිහිටි ඉඩම මැනුම් කටයුතු සිදු කර ගැනීම සම්බන්ධව මැනුම් ඉල්ලීම් අංකය - KDS/PBK/4/4/හොරේහින්න(485) (ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මහනුවර වෙත යවන ලද ලිපියේ පිටපත) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 02 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එස්. එල්. පෙරේරා මහතා වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් බච්චාගම සිරි

ධම්මරතන පිරිවෙන් විහාරස්ථානය සඳහා ඇඳි රහිත පුටු ලබා දීම සඳහා සහා අරමුදලින් රු. 100,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයහාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 03 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එස්. එල්. පෙරේරා මහතා වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් හෝල්ගම ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය සඳහා ඇඳි රහිත පුටු ලබා දීම සඳහා සහා අරමුදලින් රු. 100,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයහාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
2023 වර්ෂයේ වෙන් වී ඇති ප්‍රතිපාදන මගින් පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (පළාත් පාලන සහකාර කොමසාරිස් - මහනුවර, මාතලේ, නුවරඑළිය වෙත යවන ලද ලිපියේ පිටපත) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
2023 වර්ෂයේ වෙන් වී ඇති ප්‍රතිපාදන මගින් පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
අඛණ්ඩ විදුලි සැපයිමක් තහවුරු කිරීම සඳහා වන කඩිනම් විදුලි සංරක්ෂණ වැඩසටහන යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 07 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම ස්වාමීන්වහන්සේ වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් රොසැල්ල හයිඩ්‍රිවත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයට විදුරු පිහන් සහ පීරිසි කෝප්ප ලබා දීමට සහා අරමුදලින් රු. 30,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයහාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ටෙම්පල්ස්ටෝවත්ත පොදු වොලිබෝල් ක්‍රීඩා පිටියේ විදුලි සම්බන්ධතාවය ලබා දීම හා විදුලි බල්බ සවිකර සංවර්ධනය සඳහා සහා අරමුදලින් රු. 159,488.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 09 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ටෙම්පල්ස්ටෝවත්ත ලකී බෝයිස් ක්‍රීඩා සමාජය සඳහා වොලිබෝල් නෙට් හා ක්‍රිකට් ක්‍රීඩා කරන බැට් හා බෝල ලබා දීම සඳහා සහා අරමුදලින් රු. 19,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 10 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
ප්‍රජා සංවර්ධන වාර්ෂික ඉලක්ක වැඩසටහන - 2023 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 11 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සකස් කිරීම ඩබ්. ජී. සිල්වා මයා - වැඩ තහනමට ලක් වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 12 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
2022.11.24 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සම්න්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 13 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
පූර්ණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම - 2021 වර්ෂය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 14 මහලේකම්, එක්සත් ජාතික පක්ෂය
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරහඳුන්ගල ඕවිටේ ගෙදර සෝමතිලක මහතා එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය අහෝසි කොට නෙරපා හැරීම (තේරීම් භාර නිලධාරී, සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය, මහනුවර වෙත යවන ලද ලපියේ පිටපත) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 – 15 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

කාර්යාලය පිළිසකර කර ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 – 16 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
ලේඛනාගාරයෙන් ලිපිගොනු ඉවත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 – 17 Senior Deputy Director, Board of Investment of Sri Lanka, Colombo
Renewal of Environmental Protection Licence (EPL) යන මැයෙන් වූ ලිපිය (Mr, Ranjana Mahindasiri, Group HR & Admin. Manager, Farms Pride (Pvt) Ltd, No. 272, Jayamalapura, Gampola වෙත යවන ලද ලිපියේ පිටපත) සභාගත කරන ලදි.

02 – 18 Director General, Central Environmental Authority, Battaramulla
Proposed Duriyan Cultivation Project ar Nagasthenna Estate, Yatiyantota and Pasbage Korale Divisional Secretariat Divisions යන මැයෙන් වූ ලිපිය (Managing Director, Nelna agri Development (Pvt) Ltd, Meethirigala වෙත යවන ලද ලිපියේ පිටපත) සභාගත කරන ලදි.

02 – 19 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
මැදගහවතුර ක්‍රීඩාංගණයේ වැලි ඉවත් කිරීමට JCB යන්ත්‍රය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි සභාගත කිරීම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කළමනාකරු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එවන ලද සෙල්ලිපිගම සිට රඹුක්පිටිය පාසල දක්වා ජලනල එලීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවට අයිති මාර්ගවල ජලනල එලීම සඳහා අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් යුතු ලිපියට අනුව බලංතොට, රඹුක්පිටිය ප්‍රදේශයේ ජනතාව වෙත පානීය ජල පහසුකම් සැපයීම සඳහා ජලනල එලීමේ කටයුතු ආරම්භ කරන බැවින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල ජලනල එලීමේ කටයුතුවලදී මාර්ග උරහිස පලුදු කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිලධාරි විසින් නිර්දේශ කරන කොන්දේසිවලට යටත්ව නැවත තිබූ පරිදි මාර්ගය සකස් කිරීමේ පදනම මත අවසර ලබා දීමටත් මාර්ගවල දුර ප්‍රමාණයන් සංශෝධනය වන බැවින් එම නව දුර ප්‍රමාණයන්වල තොරතුරු නැවත ලබා ගැනීමටත් සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළය ප්‍රාදේශීය සභාව විසින් සිදු කර ගෙන යනු ලබන ඉහුරුඔය පාලම ප්‍රතිසංස්කරණය සහ බෝහිල්වත්ත පාලම ඉදිකිරීම යන කර්මාන්ත 02 සඳහා ඇස්තමේන්තුවේ වෙන් කර ඇති මුදලින් වැටුප් ගෙවීම සිදු කිරීම සඳහා යොදා ඇති වැඩබිම් අධීක්ෂකවරුන් වන ඒ. සී. ලසන්ත සහ කේ. ජී. පී. එන්. චතුරංග යන අය සඳහා 2023 ජනවාරි මාසයේ සිට දිනකට රු. 2,400.00 බැගින් වන වැටුප සභා අරමුදලින් ගෙවීම් සිදු කර එම කර්මාන්ත සිදු කරන බණ්ඩාරනායක කන්ස්ට්‍රක්ෂන් ආයතනය සඳහා ඉදිරිපත් කරන බිල් පත්‍රවල ගෙවීම්වලින් ප්‍රාදේශීය සභා අරමුදලට පියවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පළාත් පාලන කොමසාරිස් විසින් ලද බෝහිල්වත්ත පාලම ඉදිකිරීම යන මැයෙන් වන ලිපියට අනුව බණ්ඩාරනායක බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ විසින් ඉල්ලීම් කර ඇති පරිදි බෝහිල්වත්ත පාලම ඉදිකිරීම කොන්ත්‍රාත්තුව යටතේ Steel Section Galvanize කිරීම සඳහා ඇණවුම් භාර දී ඇති බවත් දැඩි ලෙස මිල විචලනය වීම හේතුවෙන් ඇස්තමේන්තු මුදලට වඩා වැඩි මුදලක් වැයවන බවත් දන්වා ඇත. එබැවින් පළාත් පාලන කොමසාරිස්තුමා උපදෙස්

දී ඇති පරිදි මිල වැඩිවීම 20% ඉක්මවා නොයන පරිදි ගෙවීම් කිරීම මධ්‍යම පළාත් සභාව මඟින් ලැබෙන ප්‍රතිපාදන වලින් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කෝපියාවත්ත මුල්ල ජනපදයේ මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා මීට පෙර ඉල්ලා තිබූ තාර බැරල් හා පොරිමැග් කියුබ් 05 සඳහා සභා අනුමැතිය ලැබී තිබුණද තාර බැරල් ලබා ගැනීමට නොහැකි වූ නිසා ඒ වෙනුවට සිමෙන්ති කොට්ට හා වැලි ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
PF – 7405 දරන කැබ් රථයේ ටයර් 04 ගෙවී ඇති බැවින් එම ටයර් 04 අළුතෙන් දැමීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්. එල්. අරුණ ශාන්ත මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් වඩාත් හොඳ වර්ගයේ ටයර් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පල්ලේගම වෙලේගෙදර ගමට යාම සඳහා දැනට පවතින අඟුරුවල මාර්ගයේ සිට උලපනේ දෙසට මාර්ගයක් සකස් කිරීම සඳහා සැලසුම් කර ඇත. එම මාර්ගය දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩමෙන් සුළු කොටසක්ද පෞද්ගලික ඉඩම්වලින් වැඩි කොටසක්ද යෝජනා වී ඇත. මෙම කොටස ගම්පොල සිට නාවලපිටිය දෙසට සැතපුම් කණු 84 ¼ සිට සැතපුම් කණු 84 ½ අතර අයත්ය. දුම්රිය මාර්ගයේ සිට මීටර් 20 ක් පමණ ඇත්ව පිහිටා තිබීමත් එම මාර්ගයට බාධාවක් නැත. ඉහත දුම්රිය රක්ෂිතයෙන් මාර්ගය සකස් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගෝනාවලපතන ගමේ සිරිවර්ධන මහතාගේ නිවසේ සිට පහළට පිවිසෙන මාර්ගයේ පහළ කොටස එනම්, ඩබ්. ජී. ධර්මසිරි මහතාගේ නිවසේ සිට ඉහළට මාර්ගය ඉතාමත්ව අබලන්ව පවතින බැවින් මෙම මාර්ගය සකසා දීම සඳහා 09. ප්‍රාග්ධන වියදම් යටතේ 309-3 ii. සහා අරමුදල් වැය ශීර්ෂය යටතේ රු. 100,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 –08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රොසැල්ල, විග්ටන් පහළ කොටස, විග්ටන් යෞවන සමාජය සඳහා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවෙන් ජංගම පුස්තකාලය සඳහා අවශ්‍ය පොත්පත් මෙන්ම උපකරණ ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ගොන්දෙන්නාව නව ටෙක්ස් පාර දැනට කොන්ක්‍රීට් කර ඇත්තේ ස්වල්ප වශයෙනි. ඉතිරිව ඇති ප්‍රමාණය කොන්ක්‍රීට් කර දෙන ලෙස ගම්වාසීන් විසින් කර ඇති ඉල්ලීමට අනුව ඒ වෙනුවෙන් රු. 50,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 –10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ටිල්ටන් පල්ලේගම ප්‍රජා මණ්ඩල සමිතිය විසින් ඉටු කරගෙන යන ඇල මාර්ග ඔස්සේ මිනිසුන් ගමන් කරන මාර්ගය හා ක්‍රීඩා පිටියට යන මාර්ගය අදියර කීපයකින් වැඩ කර ඇති බැවින් මෙම මාර්ගයේ වැඩ අවසන් කිරීම සඳහා ටිල්ටන් පල්ලේගම ප්‍රජා මණ්ඩල සමිතිය කර ඇති ඉල්ලීමට අනුව බෝක්කු බට ලබා දීම සඳහා 09. ප්‍රාග්ධන වියදම් යටතේ 309-3 ii. සහා අරමුදල් වැය ශීර්ෂය යටතේ රු. 50,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභා කාර්ය මණ්ඩලය, මහජන පුස්තකාල පාඨකයන්, ජංගම පුස්තකාල පාඨකයන් හා එක්ව සංවිධානය කරන සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය සඳහා වාර්ෂික අයවැයෙන් 605 – 9 iii වැය ශීර්ෂය යටතේ වෙන් කර ඇති රු. 100,000.00 ක මුදල ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

LL – 7484 දරන කැබ් රථයේ පහත දෝෂ හේතුවෙන් ධාවනය කිරීම අවදානම් තත්වයක පවතින බව රියදුරු මහතා විසින් එම දෝෂ නිවැරදි කර දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව පහත දෝෂයන් සකස් කර ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. වින්පින් ගැසීම
2. බ්රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම
3. පිටුපස සීට් පද්ධතිය සෑදීම
4. දුණු බුෂ් ගැසීම
5. දොරපින් ගැසීම

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ඉංජිනේරු වාර්තාවක් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

වරකාව අන්දන්ගොඩවත්ත මාර්ගයේ කාණු පද්ධතියට බෝක්කු බට දමා එම කාණුව සකසා දීමට ඒ සඳහා බෝක්කු බට ලබා දීම වෙනුවෙන් 09. ප්‍රාග්ධන වියදම් යටතේ 309-3 ii. සභා අරමුදල් වැය ශීර්ෂය යටතේ රු. 50,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මඟින් ඇස්තමේන්තු සකස් කොට ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
වැලිගම්පල කැන්දෝපිටිය වසමට ජලය නොමැතිකම නිසා කොට්ටුන්න පිහිල්ලෙන් ජලය එම වසමේ ජනතාවට ජලය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහා 404 – 2 ගොඩනැඟිලි පහසුකම් හා වෙනත් ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව වැය ශීර්ෂය යටතේ රු. 100,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මයා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මඟින් ඇස්තමේන්තු සකස් කොට ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023.03.07 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු නිර්දේශ මත නොමිලේ පැවැත්වීමට යෝජිත මැහුම් පාඨමාලාව සඳහා ලොකු CR පොත් 02, වයිට් බෝඩ් 01, මාකර් පෙන් 06 ක්, වයිට් බෝඩ් ඩස්ටර් 01 මිලදී ගැනීමටත් 5′ x 3′ ප්‍රමාණයේ ෆ්ලෙක්ස් එකක් සැකසීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මොන්තක්‍රිස්ටෝ ජල යෝජනා ක්‍රමය සඳහා ලීටර 1000 ප්ලාස්ටික් ජල ටැංකියක් ලබා දීම සඳහා 404 – 2 වැය ශීර්ෂය යටතේ රු. 25,000.00 ක් වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී. එස්. ඒ. ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පෙන්රෝස් වත්ත ඉහළ කොටසේ ජල ගැටළුවක් පවතින බැවින් වතු නිවාස වලට ඉහළින් ඇති ජල ප්‍රභවය ආශ්‍රයෙන් ජලය ලබා ගැනීමේදී ජලය රඳවා ගැනීමේ ස්ථානය නිසි ලෙස සකස් කිරීම සඳහා සිමෙන්ති කොට්ට 05 ක් හා මැටල් කියුබ් ½ ක් එම ප්‍රදේශයේ පදිංචි ජනතාව විසින් කර ඇති ඉල්ලීමට අනුව ඒ සඳහා 404 – 2 වැය ශීර්ෂය යටතේ රු. 35,000.00 ක් වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්. ඒ. ටී. පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මඟින් ඇස්තමේන්තු සකස් කොට ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 18 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නවගම්මාන ලැයිම් නිවාස සඳහා ජල ගැටළුවක් පවතින බැවින් වතු නිවාස වලට ඉහළින් ඇති ජල ප්‍රභවය ආශ්‍රයෙන් ජලය ලබා ගැනීමේදී ජල මූලාශ්‍රයේ සිට වතු නිවාස සඳහා ජල නල පද්ධතියක් නිසි ලෙස සකස් කිරීම සඳහා සිමෙන්ති කොට්ට 05 ක් හා

මැටල් කියුබ් ¼ ක් එම ප්‍රදේශයේ පදිංචි ජනතාව විසින් කර ඇති ඉල්ලීමට අනුව ඒ සඳහා 404 – 2 වැය ශීර්ෂය යටතේ රු. 25,000.00 ක් වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී. එස්. ඒ. ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මඟින් ඇස්තමේන්තු සකස් කොට ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඉඹුල්පිටියවත්තේ ග්‍රීන්වුඩ් කොටසේ පවතින ජල ප්‍රශ්නයට විසඳුමක් ලෙස එම කොටසේ පවතින දිය උල්පතේ සිට ජලය ලබා ගැනීම සඳහා එම ප්‍රදේශයේ ජනතාව විසින් ලීටර 2000 ජල ටැංකියක් හා බට ඇතුළුව අනෙකුත් උපාංග ඉල්ලීම් කර ඇත. ඒ අනුව ඒ සඳහා 09. ප්‍රාග්ධන වියදම් යටතේ 309-3 ii. සහා අරමුදල් වැය ශීර්ෂය යටතේ රු. 100,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මඟින් ඇස්තමේන්තු සකස් කොට ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ෂෙම්රෝක් ක්‍රීඩාංගණයේ වැටී ඇති පස් ඉවත්කිරීමට JCB යන්ත්‍රය ලබා දීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්. ඒ. ටී. පුෂ්පකුමාර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 21 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 මාර්තු මස සභික දීමනා ප්‍රතිපූර්ණය වන තෙක් සභා අරමුදලින් ගෙවීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 22 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සිල්වාස්ලැන්ඩ් පොදු ඉඩමේ කඩකාමර පිහිටි බිම් කොටස් සඳහා වාර්ෂිකව සිදු කරන බිල් කිරීමට අදාලව අවු. 05 න් 05 ට තක්සේරු කර ගැනීම සිදු කළ යුතු වේ. 2018 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව 2023 වර්ෂයෙන් අවසන් වන බැවින් 2024 වර්ෂය සඳහා බිල් කිරීමට නව තක්සේරුවක් ලබා ගත යුතු වේ. මේ සඳහා අදාල බිම් කොටසේ බිම් සැකැස්ම ඉදිරිපත් කළ යුතු වේ. බිම් කොටස් 15 හි හිමිකරු වන එම්. ජී. මල්ලිකා මහත්මිය සඳහා 2018 වර්ෂයේ ලබා දී ඇති තක්සේරුව ගෙවීමට අපහසු බවත් තක්සේරුව අඩු කර දෙන ලෙස සභාව වෙත දන්වා ඇති අතර, ඇයට හිමි බිම් කොටසේ ප්‍රමාණය පිළිබඳව ගැටළුකාරී තත්වයක් පවතින බැවින්, නැවත මැනුම් සිදුකර නව තක්සේරුවට යොමු කිරීම සුදුසු වන බවත් එබැවින් අදාල බිම් කොටස මැනුම් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඉදිරි කටයුතු කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ. ජී. ටී. ඒ. සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 23 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පානීය ජල සුරක්ෂිතතාවය පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාව සභා සම්මත අතුරු ව්‍යවස්ථාවක් ලෙස සම්මත කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

**........................ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. ................... ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස පෞද්ගලික භාවිතය හා පොදු භාවිතය තුළ පානීය ජල සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම පිණිස ඊට අදාල ජල මූලාශ්‍ර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතිවලට අදාල ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාල ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු පානීය ජල සුරක්ෂිතතාවය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.
2. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) හා 126 (XIII) යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ .................. ප්‍රාදේශීය සභාවට බලතල පිරිනැමී ඇත.
3. මෙම අතුරු ව්‍යවස්ථාව ....................... ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂකසුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හදුන්වනු ලැබේ.
4. ................ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුල පිහිටියාවූ මහජනතාවගේ පරිභෝජනය සඳහා පානීය ජලය සපයන සෑම ජල මූලාශ්‍රයකටම අදාලව පහත සඳහන් තොරතුරු පවත්වාගත යුතුය.
   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම
   iii. ග්‍රාම නිලධාරී වසම
   iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
   vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)
5. ජල මූලාශ්‍රය භූගත ජල මූලාශ්‍රයක් වන විටදී ඉන් මීටර 15ක අරයකින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනිම නොකළ යුතුය.
   i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල් වීමට ඉඩ සැළසෙන ආකාරයට පවත්වාගෙන යාම.
   ii. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
   iii. විවෘත අවකාශය තුල ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.
   iv. කැනීම් සිදු කිරීම
   v. කිසියම් කානුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ ඉදිකර ඇති කානු පළුදු තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ඉඩ හැරීම.
   vi. කවර හෝ දුරක සිට මූලාශ්‍රයට මතුපිට ජලය එකළුල්ලේ ගලා ඒමට සැළැස්වීම.
   vii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විට දී ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5ක අඩු දුරක සිට පොළොව මතුපිට ජලය ළිඳ තුලට කාන්දු වීමට ඉඩ හැරීම.
   viii. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, බිම් මට්ටමේ සිට මීටර් 3කට වඩා අඩු ගැඹුරකින් ළිඳට ජලය කාන්දු වන ආකාරයට පවත්වා ගැනීම.
   ix. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ළිඳේ ආරක්ෂාව සඳහා සිමෙන්ති හා යකඩ යොදා වැර ගැන්වූ කොන්ක්‍රීට් හා ළිං ආවරණ යොදා ඇති අවස්ථාවක ඒ සඳහා භාවිතා කර ඇති සිමෙන්ති ජලයට මුසුවන පරිදි හෝ යකඩ ආශ්‍රිතව ගොඩනැගෙන මළ බැඳීම් ජලයට මුසුවන පරිදි පවතින ආකාරයෙන් තිබීමට ඉඩ හැරීම.
   x. ජල මූලාශ්‍රය නොගැඹුරු ළිඳක් වන විටදී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විසින් නියම කරන කාල සීමාවන් තුළ ළිං ජලය සම්පූර්ණයෙන්ම හිස්කර ළිඳ මනා පවිත්‍රතාවයෙන් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම.
6. ස්වාභාවික මතුපිට ජල මූලාශ්‍රයක් වන විටදී තුළුමුවේ සිට දෙපසට හා ඉහළටමීටර 30කින් හා පහළට මීටර් 10කින් යුත් සීමාව තුළ කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනිම නොකළ යුතුය.
   i. සතුන් ඇතුල් කිරීම, ගාල්කර තැබීම, දිගේලි කිරීම හෝ සතුන් ඇතුල්වීමට ඉඩ සැළසෙන ආකාරයට පවත්වාගෙන යාම.
   ii. වාහන සේදීම හෝ වෙනත් කවර හෝ යන්ත්‍රෝපකරණ සේදීම.
   iii. ස්නානය සඳහා භාවිතය.
   iv. කවර හෝ අපද්‍රව්‍යයක් බැහැර කිරීම, වැළලීම හෝ තැන්පත් කිරීම.
   v. විවෘත අවකාශය තුල ගිණි තැබීම් සිදුකිරීම හෝ ජල මූලාශ්‍රයට හානි වන ආකාරයේ කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම.

vi. කැනීම් සිදු කිරීම
vii. කිසියම් කානුවක් මගින් අපජලය යොමුවන ආකාරයේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
viii. වන වගාවක් නොවන වෙනත් කිසිදු වගා කාර්යයක් සඳහා යොදා ගැනීම.
ix. කවර හෝ තැනැත්තෙකු විසින් ජල මූලාශ්‍රයට කිසියම් අපද්‍රව්‍යක් මිශ්‍ර විය හැකි පරිදි ජලය පිටතට ගැනීම සඳහා වන බාල්දියක් හෝ වෙනත් කවර හෝ මෙවලමක් භාවිතයට ගැනීම.

7. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් භාගෘහස්ථ භාවිතයක් සඳහා වන ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හැර, ජල මූලාශ්‍රයක් භාවිතා කරමින් පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් හෝ ආයතනයක් විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දෙවෙනි උපලේඛණයට සාරාණුකූල වූ බලපත්‍රයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් ලබාගත යුතුය.
8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සාදන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය.
9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

10. 1 ජලය බෙදාහැරීම ජල නල පද්ධතියක් පමණක් භාවිතා කරමින් පරිභෝජනය සඳහා ජලය බෙදාහරින අවස්ථාවකදී

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) ඉල්ලුම්කරනු ලබන්නා ප්‍රජා මූල සංවිධානයක් වන විටදී ප්‍රාදේශීය සභාවේ හෝ ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) ජල යෝජනා ක්‍රමයට අදාල වන සියළු සංරචක ඇතුලත් සැළැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියළු සංරචක හා ඉදිකිරීම් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

(5) ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නල පද්ධතිය පෞද්ගලික දේපලක් මතින් යෙදවීමේ දී ඊට අදාල ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපලක් මතින් යෙදවෙන විටදී ඊට අදාල අධිකාරිත්වය විසින් ඊට අදාල අවසරය ලබා දී ඇති බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(6) ජල ව්‍යාපෘතිය යටතේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සේවකයින් සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය යටතේ ඉල්ලා සිටින තොරතුරු හා සේවකයින් වෙනස් වන සෑම අවස්ථාවකදීම ඊට අදාල තොරතුරු ඉදිරිපත් කරන බවට සහතික විය යුතුය.

10.2 ජලය බෙදාහැරීම බවුසරයක් හෝ ජල බහාලුමක් හෝ කවර හෝ මෙවලමක් භාවිතයට ගනිමින් ජලය එක්රැස්කර වාණිජ පරමාර්ථයන් වෙනුවෙන් ජලය බෙදාහැරීමක් සිදුකරන විටකදී,

(1) බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට යටත් බවට තහවුරු කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යන ජල මූලාශ්‍රයක් යටතේ ලබාගනු ලබන ජලය බවට තහවුරුවක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(3) භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍ර සම්බන්ධයෙන් හා බෙදා හරින ජලය සම්බන්ධයෙන් 1964 අංක 24 දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුව අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට එම මණ්ඩලය වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය.

(4) භාවිතය සඳහා ලබාදෙන ජලය, ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශිත කවර හෝ ක්‍රමවේදයක් යටතේ ජලය පිරිපහදු කර තිබීම.

(5) ජලය බෙදා හැරීම සඳහා යම් වාහනයක්, බහාලුමක් හෝ වෙනත් යම් මෙවලමක් භාවිතයට ගන්නේනම් එසේ යොදාගනු ලබන භාවිතය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලීම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් පත්‍රය ලැබී මාසයක් ඇතුලත අපේක්ෂිත බලපත්‍රය ලබා දීම හෝ එසේ ලබාදිය නොහැකිනම් ඒ සඳහා වන හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.
12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ගැසට් පත්‍රෙය් පලකිරීමෙන් පසුව වලංගු වන්නේය.
13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

i. බෙදාහරින ජලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.
ii. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන සියළු සංරචක ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.
iii. බලපත්‍රය ඉල්ලුම් කිරීමේ දී තහවුරු කරන ලද ජල මූලාශ්‍රය වෙතින් ලබා ගන්නා ලද ජලය බලපත්‍රයට අදාල වන කාර්යයන් සඳහා යොදාගනු ලබන බවට තහවුරු වන පරිදි ක්‍රියා කළ යුතුය.

- iv. ජලය බෙදාහැරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා වෙනත් මෙවලම් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති ප්‍රමිතීන්ට අනුකූලව නිපදවා තිබිය යුතුය.
- v. භාවිතයට ගනු ලබන ජල මූලාශ්‍රය හා බෙදා හරින ජලය 1964 අංක 24 දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ප්‍රකාශිත නියෝගයන්ට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.
- vi. යොදාගනු ලබන සෑම සේවකයෙක්ම චර්මගත රෝගයකින් හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ එවැනි අයෙකු ඇසුරු කළ අයෙකු නොවිය යුතුය.
- vii. සේවයේ යොදවන සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය ආරක්ෂිත හා පිරිසිදු තත්වයේ ඇඳුම් ඇඳ සිටිය යුතු අතර, නියමිත පරිදි අත්වැසුම් පැළඳ සිටිය යුතුය.
- viii. බල ප්‍රදේශය තුළ රෝග වැළැක්වීම හා නිරෝධායන ආඥා පනතට අනුකූලව නියෝග ක්‍රියාත්මක වන අවස්ථාවක දී එම නියෝගයන් යටතේ දක්වා ඇති කොන්දේසීන්ට අනුකූලව සේවාවන් පවත්වාගත යුතුය.
- ix. ජල ව්‍යාපෘතියට අදාලව සේවයේ යොදවනු ලබන සෑම සේවකයෙකුම බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන තොරතුරුවලට නම් ඇතුලත් කරන ලද හෝ ඉන් පසු කවර හෝ අවස්ථාවක සේවයට යොදාගනු ලැබීනම් ඒ පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරුවලට නම් ඇතුලත් කරන ලද අයෙකු විය යුතුය.
- x. ජල ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයන් පිළිබඳව සෑම මාස හයකටම වරක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිර්දේශ කරන කාල සීමාවන් යටතේ සේවකයින් අදාල සේවයේ යෙදවීම යථා යෝග්‍ය බවට තහවුරු කරන සහතිකයක් මගින් සනාථ කර තිබිය යුතුය.

14. බල ප්‍රදේශය තුළ වූ කිසියම් ජල මූලාශ්‍රයක් ජාතික ජල සම්පාදන මණ්ඩලය හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයක් යටතේ භාවිතයට ගනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය ලත් තැනැත්තා හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් එම ජල මූලාශ්‍රය භාවිතයට ගැනීමක් හෝ ඊට අයුතු ජල සම්බන්ධතාවයක් පවත්වා ගැනීම නොකළ යුතුය.
15. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාල වන කවර හෝ ජල මූලාශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූලව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සුදුසු හා සාධාරණයැයි සැළකිය හැකි වේලාවකදී සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද කවර හෝ සභාවේ නිලධාරියෙකු ජල මූලාශ්‍රය පිහිටි පරිශ්‍රයට ඇතුල් වීම, සාම්පල් ලබා ගැනීම හෝ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන වෙනත් තොරතුරක් ඉල්ලා සිටීම, පානීය ජලය බෙදාහරින යම් අවස්ථාවක එසේ බෙදාහරින ජලය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා යොදාගනු ලබන බහාලුම් හා මෙවලම් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකිරීම, ඒ සඳහා අවශ්‍යයැයි හැඟෙන තොරතුරක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.
16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය සභාපතිවරයා විසින් විශේෂයෙන් අවලංගු කරනු නොලැබුවේනම් නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය.
17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට පටහැනිව යම් පානීය ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජලය බෙදා හැරීමේ දී ඒ පිළිබඳව හඳුනාගනු ලබන කවර අවස්ථාවක දී වුවද බලපත්‍රලාභියා වෙත අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා සභාපතිවරයා විසින් සාධාරණ කාලයක් ලබා දෙමින් ලිඛිත දැන්වීමක් භාරදිය යුතුය. එසේ ලබාදෙන සාධාරණ කාලය දින 14කට නොවැඩි විය යුතුය.
18. ඉහත වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව යටතේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීමට කිසියම් බලපත්‍රලාභියෙක් අපොහොසත්වන අවස්ථාවකදී සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරමින් ඒ බව බලපත්‍රය ලත් තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.
19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහන් කරනු ලැබුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන බලපත්‍රයක් සඳහා අදාල වන කිසියම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පළමු වරට බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලබන විටදී හා ලබාගත් බලපත්‍රයක් යටතේ වන ජල ව්‍යාපෘතියකට අදාලව වෙනස්කම් සහිතව නැවත බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයාට ඊට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරනු ලබන කමිටුවකින් නිර්දේශ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් ඊට අදාල බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය.
20. මෙම අතුරු ව්‍යවස්ථාවේ 19 වගන්තියේ කාර්යය සඳහා හා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් පානීය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි කමිටුවක් විය යුතුය.
    - i. සභාපති
    - ii. ලේකම්
    - iii. තාක්ෂණික නිලධාරී
    - iv. පරිසර නිධාරී
    - v. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් නම්කරන නිලධාරියෙකු

    කෙසේ වුවද සේවයේ අවශ්‍යතාවය පරිදි කමිටුවේ පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා කමිටුවේ සභායට සභාවේ සභාපතිවරයා විසින් නම්කරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු කැඳවීමට ඉහත සඳහන් විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රයකට යටත්ව, බලපත්‍රයකින් තොරව ජල මූලාශ්‍රයක් භාවිතයට ගැනීමේ දී හෝ පානීය ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ දී හෝ 5 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දඩුවමකට යටත් විය යුතුය.
22. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට බල ප්‍රදේශය තුල ක්‍රියාත්මකව පවතින මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පානීය ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූල වීම සඳහා කිසියම් ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙක්, ආයතනයක් හෝ සංවිධානයක් විසින් කිසියම් කාල සීමාවක් ඉල්ලා සිටින්නේනම් 20වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සභාපතිවරයා විසින් සහන කාලයක් ලබා දීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මෙම වගන්තිය යටතේ ලබාදෙන සහන කාලය මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනෙන් පළමුවෙන් එළඹෙන ලිත් වර්ෂයක කාලය නොඉක්මවන කාලයක් නොවිය යුතුය.
23. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

    ප්‍රාදේශීය සභාව යන්නෙන් ...... ප්‍රාදේශීය සභාව ද,

    සභාපතිවරයා යන්නෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත අනුව ........ ප්‍රාදේශීය සභාව සඳහා පත්වන සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ ධුරය ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී සභාපතිවරයාගේ ධුරයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා ලිඛිත නීතියට අනුකූලව පත්වන ලබන අයෙකුද,

    අපද්‍රව්‍ය යන්නෙන් වරින් වර සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ අපද්‍රව්‍ය සඳහා ලබා දී ඇති අර්ථයමද,

    බලය පවරන ලද නිලධාරී යන්නෙන් සභාපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධාරියෙකු ද,

    ජලමූලාශ්‍රයක් යන්නෙන් පානීය ජල අවශ්‍යතාවයක් වෙනුවෙන් පොළව මතුපිට ජලය හෝ භූගත ජලය භාවිතයට ගැනීම සඳහා හේතුවන ස්වාභාවික හෝ කෘතිමව සිදුවන ජලය ඒකරාශී වීමක් හෝ පොදු පානීය ජල පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් ද,

## <u>උපලේඛන අංක 1</u>

**<u>පානීය ජලය ලබා ගැනීම සඳහා ජලමූලාශ්‍ර භාවිතය බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය</u>**

1. ඉල්ලුම් කරුගේ නම
2. ලිපිනය
3. ඉල්ලුම්කරු ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි අංකය /ඉල්ලුම්කරු සමිතියක් වන්නේ නම් අදාල සමිතියේ ලියාපදිංචි අංකය

4. ජල මූලාශ්‍රය පිහිටි ස්ථානය පිළිබඳ පහත සඳහන් තොරතුරු

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම (දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
iii. ජල මූලාශ්‍රෙය් ස්වභාවය
iv. ග්‍රාම නිලධාරී වසම
v. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
vi. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vii. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
viii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

5. ජල ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන සේවකයන් පිළිබඳ තොරතුරු

| අ/අ | නම | ලිපිනය | ජා.හැ.අ |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ව්‍යාපාරය සඳහා භාවිතා කරන වාහන සම්බන්ධ තොරතුරු

| අ/අ | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| | | |
| | | |

ඉහත අංක 05 සහ 06හි තොරතුරු වෙනස් වන සෑම අවස්ථාවකම සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

7. යෝජිත ජල ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව
8. දෛනිකව භාවිතා කිරීමට අපේක්ෂිත ජල ධාරිතාවය

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය.

i. සමිතියක් නම් ව්‍යවස්ථාවේ පිටපතක් සහ සමිතිය ලියාපදිංචි සහතිකයේ පිටපතක්
ii. ජල ව්‍යාපෘතියට අදාළ සංරචක උපයෝගී කර ගෙන ඇති ආකාරය පැහැදිලි වන පරිදි පිළිගත හැකි තාක්ෂණික නිලධාරියෙකු විසින් සහතික කරන ලද දල සැලැස්ම
iii. ජල යෝජනා ක්‍රමයට අදාල වන සියළු සංරචක ඇතුලත් සැළැස්ම
iv. ජල යෝජනා ක්‍රමය සඳහා යොදනු ලබන ප්‍රධාන නල පද්ධතිය පෞද්ගලික දේපලක් මතින් යෙදවීමේ දී ඊට අදාල ස්වාමිත්වය විසින් ද, වෙනත් යම් අධිකාරියකට අයත් දේපලක් මතින් යෙදවෙන විටදී ඊට අදාල අධිකාරිත්වය විසින් ඊට අදාල අවසරය ලබා දී ඇති ලේඛන

අයදුම්කරුගේ අත්සන
දිනය

(මෙම අයදුම්පත්‍රය සමග අදාළ මාර්ගෝපදේශ ඇතුළත් ලේඛනයේ පිටපතක් ලබා දෙනු ලැබේ)

<u>උපලේඛන අංක 2</u>

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල මූලාශ්‍රයක් භාවිතා කර පානීය ජල ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. ජා.හැ.අ. –
4. අවසර ලබා දෙනු ලැබූ ජල මූලාශ්‍රය -
5. අවසර දෙනු ලැබූ කාලය -

දිනය

......................................

සභාපති
ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී ජී. එස්.ඒ. ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 24 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂයේ ගරු මන්ත්‍රී එස්. එල්. අරුණ ශාන්ත මයාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 100,000.00 ක මුදලක් මාපාකන්ද උතුර ප්‍රජා ශාලාව සඳහා යොදා ඇති අතර, එම යෝජනාව සංශෝධනය කර එම මුදල ගල්පොත්ත සුගතාරාම විහාරස්ථානයේ බුදුමැදුර සඳහා යෙදවීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්. එල්. අරුණ ශාන්ත මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 25 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

2023 වර්ෂයේ ගරු උප සභාපති එච්. ඒ. නන්දසෝම මයාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 50,000.00 ක මුදලක් බලංතොට දකුණ ශාන්ත ජනපද ක්‍රීඩා සමාජය සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම සඳහා යොදා ඇති අතර, එම යෝජනාව සංශෝධනය කර එම මුදල ශාන්ත ජනපද එම්. ඩී. කරුණාරත්න මයාගේ නිවස අසල මාර්ගය ශ්‍රම පදනම යටතේ අලුත්වැඩියා කර ගැනීම සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 12 හා මැටල් කියුබ් 01 ක් ලබා දීම සඳහා යෙදවීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උපසභාපති එච්. ඒ. නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 වර්ෂයේ ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මයාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 200,000.00 ක මුදලක් ග්ලිස්ටන් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා වෙන් කර ඇති අතර, එම යෝජනාව සංශෝධනය කර එම මුදල ඉරලාගල මාර්ගය සකස් කිරීම සඳහා JCB යන්ත්‍රය ලබා ගැනීම වෙනුවෙන් එයට ඩීසල් ලබා ගැනීමට රු. 100,000.00 ක් හා විග්ටන් පහළ කොටසේ පුස්තකාලයට පොත් ලබා දීමට රු. 100,000.00 ක් වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 27 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
වරකාව - පල්ලේගම ප්‍රදේශයේ ජල ප්‍රශ්නයට විසඳුමක් ලෙස වරකාව පැරණි ජල යෝජනා ක්‍රමය නැවත සකසා ගැනීම සඳහා ප්‍රජා මණ්ඩලය සමිතියට ලැබෙන රු. 50,000.00 ක මුදලින් ජලනල ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී. එස්. ඒ. ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 28 ගරු මන්ත්‍රී අයි. රාමකිලි මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 100,000.00 ක මුදලක් ග්ලිස්ටන් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා වෙන් කර ඇති අතර, එම යෝජනාව සංශෝධනය කර එම මුදල ඉරලාගල මාර්ගය සකස් කිරීම සඳහා රු. 100,000.00 ක් වෙන් කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 29 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
CP LL 7484කැබ්රථයේ තිරිංග පද්ධතිය ඉතා දුර්වල තත්වයට පත්වී ඇති බැවින් මෙම කැබ් රථයේ තිරිංග පද්ධතිය කඩිනමින් අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී. එස්. ඒ. ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීමට අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 30 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ 2023.02.01 දිනැති කැඳවීමේ ලිපිය අනුව 2023.03.02 දින ලේකම්තුමිය කේ. ප්‍රියංකා චාන්දනී මිය හා හිටපු කළමනාකරණ සේවා නිලධාරි ඒ. කේ. නිරෝෂන් මයාද කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත. එහි දී 2020.09.05 දින අප සභාවට අයත් ජේ. සී. බී. යන්ත්‍රය (ZA 5171) භාවිතා කර විග්ටන් ප්‍රදේශයේ පෞද්ගලික පාරක් කපා ඇති බව පැමිණිල්ලක් ලැබී ඇති බව අනාවරණය වුණි. නමුත් මේ දක්වා අප සභාවට එම සිද්ධිය පිළිබඳ පැමිණිල්ලක් ලැබී නොමැත. තවද, එම යන්ත්‍රයේ දෛනික ධාවන සටහන් අනුව 2020.09.04 සහ 06 වන දින යන්ත්‍ර වැඩ කර තාක්ෂණ නිලධාරිතුමා විසින් ඒ පිළිබඳ සහතික කර ඇති නමුත් 2020.09.05 දින යන්ත්‍ර ක්‍රියා කර නොමැති බව සටහන් කර ඇත. එම හෙයින් මෙම සිද්ධිය

පිළිබඳ වර්තමාන තත්වය පරීක්ෂා කර වාර්තා කිරීම සුදුසු බව හා ඉදිරියේදී වාර්තාව අනුව එම පාර පෞද්ගලික පාරක් ලෙස තීරණය කරන්නේ නම් එදින එම යන්ත්‍රයේ ඉල්ලුම්කරුවෙක්ගෙන් අදාල පැය ගණන සඳහා වැය වූ මුදල අය කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සදහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම**

| | | |
|---|---|---|
| 06 - 01 මුදල් කාරක සභාව | - | 2023.03.08 |
| 06 – 02 කාර්මික සේවා කමිටුව | - | 2023.03.07 |
| 06 – 03 ගැටුම් සමථකරණ කාරක සභාව | - | 2023.03.07 |
| 06 – 04 නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව | - | 2023.03.07 |
| 06 – 05 පුස්තකාල උපදේශක කමිටුව | - | 2023.03.02 |

07. **බැංකු සැසඳුම් ප්‍රකාශය, අභ්‍යාන්තර විගණන වාර්තාව, ලැබීම් සාරාංශය, ගෙවීම් සාරාංශය, ගෙවීම් වාර්තාව, පුස්තකාල ප්‍රගතිය, සංවර්ධන ප්‍රගතිය ඉදිරිපත් කිරීම**

2023.02.01 දින සිට 2023.02.28 දක්වා වවුචර් අංක 138 සිට 235 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.

- බැංකු සැසඳුම් ප්‍රකාශය

## බැංකු සැසඳුම් ප්‍රකාශනය - 2023 පෙබරවාරි

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගිණුම් අංකය :- 053-1-001-6-4889286
මාසය :-2023 පෙබරවාරි

| | | | | |
|---|---|---|---|---|
| 2023.02.01 දිනට මුදල් පොතේ ශේෂය | රු. | 15,706,953.93 | | |
| එකතු කළා :- ජනවාරි මස මුළු ලැබීම් | රු. | 3,917,510.30 | | |
| අඩු කළා :- ජනවාරි මස මුළු ගෙවීම් | රු. | 4,352,896.22 | | |
| 2023.02.28 දිනට මුදල් පොතේ ශේෂය | | | රු. | 15,271,568.01 |
| එකතු කළා | | | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (උ:ලේ 01) | රු. | 287,383.71 | | |
| නිෂ්කාෂනය නොවූ චෙක්පත්(උ.ලේ.04) | රු. | 8,500.00 | | |
| බැංකුව විසින් අඩුවෙන් ගෙවා ඇති මුදල (උ:ලේ 05) | රු. | 0.35 | | 295,884.06 |
| | | | | 15,567,452.07 |
| අඩු කළා | | | | |
| අත ඉතිරි මුදල් හා චෙක්පත් (උ:ලේ 02) | රු. | 23,199.00 | | |
| බැංකු ගාස්තු (උ:ලේ 03) | රු. | 117.94 | | |
| | | | රු. | 23,316.94 |
| 2023.02.28 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | | 15,544,135.13 |

- 2023 පෙබරවාරි මස ගෙවීම් සාරාංශය

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2023 පෙබරවාරි මාසය**

| අය විෂය නාමයන් | එකතුව | මුළු එකතුව |
|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,093,079.29 | |
| 02. ගමන් වියදම් | 24,418.40 | |
| 03. සැලසුම් හා උපකරණ | 396,845.00 | |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 46,399.15 | |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 121,535.24 | |
| 06.පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 30,207.97 | |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - | |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 4,364.99 | |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **3,716,850.04** |
| ප්‍රාග්ධන වියදම් | | |
| 09.ප්‍රාග්ධන වැය | - | |
| 10. ණය ආපසු ගෙවීම් | 251,275.01 | |
| **ප්‍රාග්ධන වැය එකතුව** | | 251,275.01 |
| **පුනරාවර්ථන වැය හාප්‍රාග්ධන වැය මුළු එකතුව** | | **3,968,125.05** |
| විවිධ ණය හිමියන් | 770.00 | |
| කර්.ණයහිමියන් (309-3-I) | - | |
| කර්.ණයහිමියන් (309-3-III) | 394,840.00 | |
| කර්.ණයහිමියන් (304-5) | - | |
| 10% කර්මාන්ත තැන්පත් | - | |
| විවිධ තැන්පත් | 16,492.00 | |
| මුද්දර තැන්පත් | - | |
| දේපල ණය පොළී | 10,359.89 | |
| සේවක ණය | 64,190.00 | |
| අත්තිකාරම් | - | |
| සමුච්චිත අරමුදල | - | |
| ලිපිද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 34,080.00 | |
| ජල ගබඩා අත්තිකාරම් | 50,635.00 | |
| අහරු චෙක්පත් | - | |
| කර්.ණයගැතියන් | - | |
| **එකතුව** | | **571,366.89** |
| **2023/02/28 දක්වා මුළු ගෙවීම් වල එකතුව** | | **4,539,491.94** |

- 2023 පෙබරවාරි මස ලැබීම් සාරාංශය

පස්බාගේකෝරලේ ප්‍රාදේශීය සභාව

**2023 පෙබරවාරි මාසය සඳහා ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

| අය විෂයන් | මුළු එකතුව | |
|---|---|---|
| | රු.ශත | |
| 10 වරිපනම් හා බදු | 407,897.00 | |
| 20 කුලී | 29,258.80 | |
| 30 බලපත්‍ර ගාස්තු | 141,812.00 | |
| 40 සේවා සඳහා ගාස්තු | 259,857.22 | |
| 50 වරෙන්තු ගාස්තු | 24,062.73 | |
| 60 වෙනත් ආදායම් | 51,414.75 | |
| 70 වෙනත් ආධාර | 2,927,897.57 | |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **3,842,200.07** |
| ප්‍රාග්ධන ආදායම | - | |
| 80 මූලධන ලැබීම් | - | |
| එකතුව | | 3,842,200.07 |

| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව | | |
|---|---|---|
| **වෙනත් ලැබීම්** | | |
| ජල ණය ගැතියෝ | 6,500.00 | |
| ජල තැන්පත් | 1,000.00 | |
| මුද්දර | 12,825.00 | |
| විවිධ තැන්පත් | 64,017.27 | |
| සේවක ණය | 138,707.34 | |
| කර්මාන්ත තැන්පත් | - | |
| දේපල ණය | 10,359.89 | |
| විවිධ ණය ගැතියෝ | - | |
| අත්තිකාරම් පියවීම | - | |
| ජල ගබඩා අත්තිකාරම් පියවීම | - | |
| රු 25 මුද්දර | 1,425.00 | |
| කර්මාන්ත ණය ගැතියෝ | 27,071.45 | |
| වෙනත් ලැබීම් | - | |
| වෙනත් ලැබීම් වල එකතුව | | **261,905.95** |
| 2023/02/28 දක්වා මුළු ලැබීම් එකතුව | | **4,104,106.02** |

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 – 01 සභාව සඳහා Photocopy යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| No | Description | L.H. Chandrasekara & Brothers (Pvt) Ltd, No. 80, Kings street, Kandy | | Base HP (Pvt) Ltd, No.219/A, Peradeniya road, Kandy | | Metropolitan Technologies (Pvt) Ltd, 78/3, Primrose Road, Kandy | |
|---|---|---|---|---|---|---|---|
| | | Brand | Unit Price | Brand | Unit Price | Brand | Unit Price |
| 1 | Photocopy Machine | TOSHIBA 2329A | 268,985.00 | MP 2014D - Ricoh | 277,610.00 | Canon | 396,750.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 02 පුස්තකාල පොත් බැඳුම් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| No | Description | Sri Lanka Stores, No. 31, Kothmale rd, Nawalapitiya | | L.H. Chandrasekara & Brothers (Pvt) Ltd, No. 80, Kings street, Kandy | | New General Trading, No.06, Kumara Veediya, Kandy | | Central Stationeries, 31, Kotugodella Veediya, Kandy | Paperline Trading (Pvt) Ltd, No.14, Cross street, Kandy | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කවරින් පේපර් | | 26.50 | Nalaka | 20.38 | | 20.20 | 25.00 | | 34.00 |
| 2 | චිප් බෝඩ් | | 90.00 | Normal | 65.96 | | 63.00 | 85.00 | 1200mm | 374.00 |
| 3 | බයින්ඩින් ක්ලෝත් | 1 Mtr | 867.50 | 1 Mtr | 560.00 | | 699.00 | - | Rexin 1m | 825.00 |
| 4 | කෙම්පික්ස් | 10kg | 13,829.50 | 10kg | - | 10kg | 11,920.00 | 4kg - 4720.00 | | 11,318.00 |
| 5 | පිහිතල පැකට් | 10 pcs | 185.00 | 10 pcs | 162.50 | | 140.00 | 150.00 | | 304.00 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | පේපර් කටර් | | 157.50 | | 165.00 | | 168.00 | 145.00 | | 225.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 ගෙවීම් වවුචර මුද්‍රණය (DUPLO) කිරීමට මිල ගණන් කැඳවීම.

| No | Description | Lanka Offset Printers, 223, D. S. Senanayaka Veediya, Kandy | | Rajah Press, 6, Theater road, Nawalapitiya | |
|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකකයක මිල | වර්ගය | ඒකකයක මිල |
| 1 | ගෙවීම් වවුචර ආකෘති | Offset print | 7.90 | 56GSM paper A4 | 6.00 |
| 2 | ගමන් වියදම් ආකෘති | Offset print | 7.90 | 56GSM paper A4 | 6.00 |
| 3 | අතිකාල දීමනා ආකෘති | Offset print | 7.90 | 56GSM paper A4 | 6.00 |

උක්ත කරුණ සඳහා ආයතන 06 කින් මිල කැඳවා තිබුණද ලැබී තිබුනේ ආයතන 02 කින් පමණි. උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය කාර්යාල ලදුපත් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Rajah Press, Nawalapitiya යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 04 ශබ්ද විකාශන යන්ත්‍රයක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| No | Description | Seetha Holdings (Pvt) Ltd, No. 11A, Gampola Back Lane, Nawalapitiya | | | | |
|---|---|---|---|---|---|---|
| | | Model No | Qty | Unit Price | Total Price | Warranty |
| 1 | AHUJA PA Horan Unit &PA Driver Unit | WFA – 20”/ AU-60 | 2 | 35,990.00 | 71,980.00 | 1 year |
| 2 | AHUJA PA Amplifier | SSB80M-80W | 1 | 93,990.00 | 93,990.00 | 1 year |
| 3 | AHUJA Dynamic Unidir Microphones | AUD-98XL | 1 | 14,990.00 | 14,990.00 | 6 months |
| 4 | AHUJA PA MIC Stand | DGN | 1 | 17,990.00 | 17,990.00 | 1 year |
| | Total | | | | **198,950.00** | |

උක්ත කරුණ සඳහා ආයතන 04 කින් මිල කැඳවා තිබුණද ලැබී තිබුනේ ආයතන 01 කින් පමණි. උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 05 ටයර් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| No | Description | DTH Super dag (Pvt) Ltd, Polonnaruwa | | Sri Lanka State Trading (General) Corporation Ltd, No.449, William Gopallawa Mawatha, Kandy | | DTH Super dag (Pvt) Ltd, Polonnaruwa | | M.J.R. Peiris & Sons (Pvt) Ltd, No. 194, Katugasthota Road, Kandy | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | Type | Amount | Type | Amount | Type | Amount | Type | Amount |
| 1 | ටයර් (Pront) 195/75/16 | CEAT - 700/ 16 | 43,500.00 | 8pr SAILUN/CHINA | 52,831.00 | MAXXIES | 69,500.00 | Federal- 10pr තායිවානය | 60,628.00 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | ටයර් (Rear) 195/75/16 | CEAT - 700/ 16 | 43,500.00 | | | MAXXI ES | 69,500.00 | Nankang-10pr තායිවානය | 59,690.75 |
| | | | | | | | | GT-8pr ඉන්දුනීසියාව | 58,673.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 06 සභාව සතු ත්‍රීරෝද රථයට අවශ්‍ය ටයර් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| No | Description | Perera Tyre Service (Pvt) Ltd, 773/1, New Kandy Road, Malabe | | Sri Lanka State Trading (General) Corporation Ltd, No.449, William Gopallawa Mawatha, Kandy | | M.J.R. Peiris & Sons (Pvt) Ltd, No. 194, Katugasthota Road, Kandy | |
|---|---|---|---|---|---|---|---|
| | | Type | Amount | Type | Amount | Type | Amount |
| 1 | Tyre 400-8 | DSI Sri Lanka 6pr 2022 Savibala | 5,800.00 | 400*8-6pr CEAT/ Sri Lanka | 7,751.00 | CEAT - 6pr Sri Lanka | 5,796.00 |
| | | Himiller Sri Lanka 4pr | 4,750.00 | | | DSI - 6pr Sri Lanka | 5,796.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 07 ZA 5171 JCB යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට මිල ගණන් කැඳවීම.

| No | Description | QTY | Susantha Motors, No. 53, Imboolpitiya, Nawalapitiya | Kamala Motors, No.135/1/3, Meepitiya, Nawalapitiya | Sampath Electricals, No .175/8, Kothmale Road, Nawalapitiya |
|---|---|---|---|---|---|
| 1 | පිස්ටන් | 4 | 40,000.00 | 47,000.00 | 45,000.00 |
| 2 | සිලිච් | 4 | 19,500.00 | 21,000.00 | 20,000.00 |
| 3 | මේන් බෙයාරින් | | 18,000.00 | 19,000.00 | 19,000.00 |
| 4 | ක්‍රෑන්ක් රොඩ් බෙයාරින් | | 10,500.00 | 11,500.00 | 11,500.00 |
| 5 | කැම් බුස් | 4 | 7,500.00 | 18,000.00 | 10,000.00 |
| 6 | වැල් | 8 | 18,500.00 | 10,000.00 | 18,500.00 |
| 7 | වැල් ගයිඩ් | 8 | 9,700.00 | 8,000.00 | 9,700.00 |
| 8 | සැලැක් | 2 | 2,200.00 | 4,200.00 | 2,200.00 |
| 9 | සලාස්ටික් | 2 | 4,000.00 | 3,900.00 | 4,300.00 |
| 10 | රින්ග් (st 01) | | 26,500.00 | 31,500.00 | 30,000.00 |
| 11 | ෆෑන් බෙල්ට් | 1 | 5,700.00 | 12,500.00 | 12,500.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | බෙල්ට් සපෙස්ටර් | 1 | 11,500.00 | 23,500.00 | 22,000.00 |
| 13 | කිකර් පොම්ප් | 1 | 17,500.00 | 19,800.00 | 19,000.00 |
| 14 | රිබෝරින් කිරීම | | 50,000.00 | 57,000.00 | 50,000.00 |
| 15 | ඩිසල් පොම්ප් රෙපෙයාර් | | 190,000.00 | 195,000.00 | 192,000.00 |
| 16 | නොසොල් | 4 | 25,000.00 | 28,000.00 | 26,000.00 |
| 17 | එන්ජින් ඔයිල් | 10 l | 57,000.00 | 56,700.00 | 57,000.00 |
| 18 | ඔයිල් ෆිල්ටර් | 1 | 10,000.00 | 10,700.00 | 10,200.00 |
| 19 | ඩීසල් ෆිල්ටර් | 3 | 12,900.00 | 13,900.00 | 13,000.00 |
| 20 | ජැක් සිල් කිට් | 4 | 35,700.00 | 34,800.00 | 35,700.00 |
| 21 | ට්‍රාන්ස්මිෂන් ඔයිල් ෆිල්ටර් | 1 | 25,000.00 | 25,000.00 | 25,000.00 |
| 22 | SAE 30 ඔයිල් | 10 l | 30,000.00 | 33,500.00 | 31,000.00 |
| 23 | කන්වේන්ටර් ඔයිල් සීල් | 1 | 9,000.00 | 10,500.00 | 9,000.00 |
| 24 | එයාර් ෆිල්ටර් | 1 | 22,500.00 | 27,000.00 | 25,000.00 |
| 25 | රේඩියේටර් අලුත්වැඩියා කිරීම | | 8,800.00 | 9,500.00 | 9,000.00 |
| 26 | ඉන්ට කූලරය අලුත්වැඩියා කිරීම | | 5,000.00 | 7,000.00 | 6,000.00 |
| 27 | ඩීසල් ටැංකිය පිරිසිදු කිරීම | | 5,000.00 | 8,000.00 | 7,000.00 |
| 28 | හයිඩ්‍රොලික් ඔයිල් | 10 l | 18,000.00 | 22,700.00 | 22,000.00 |
| 29 | වැඩ කුලිය | | 90,000.00 | 100,000.00 | 110,000.00 |
| 30 | ගැස්කට් බ්රෝල් කිට් | 1 | 25,000.00 | 30,000.00 | 27,000.00 |
| | Total | | 810,000.00 | 899,200.00 | 878,600.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 08 31 ශ්‍රී 9698 ජීප් රථය අලුත්වැඩියා කිරීමට මිල ගණන් කැඳවීම.

| No | Description | QTY | Susantha Motors, No. 53, Imboolpitiya, Nawalapitiya | Kamala Motors, No.135/1/3, Meepitiya, Nawalapitiya | Indika Motors, Bulugahakotuwa, Dekinda, Nawalapitiya |
|---|---|---|---|---|---|
| 1 | ටින්කරින් කිරීම සහ වැඩ කුලිය | | 241,500.00 | 259,500.00 | 260,000.00 |
| 2 | බට කූඩුව සෑදීම | | 25,000.00 | 30,000.00 | 30,000.00 |
| 3 | ටෙන්ට් ෂීට් කවර ගැසීම | | 85,000.00 | 90,000.00 | 110,000.00 |
| 4 | කැබින් මවුන්ට් | | 20,000.00 | 20,000.00 | 35,000.00 |
| 5 | තහඩු ෂීට් | | 18,500.00 | 21,500.00 | 40,000.00 |
| | Total | | 390,000.00 | 421,000.00 | 475,000.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 09 හියුම් පයිප්ප මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| No | Description - Size | QTY | Shiyaba Kothmale Hume Pipe Industries, No. 08, Industrial Park, Nawalapitiya road, Ulapane |
|---|---|---|---|
| 1 | 4' x 8' | 1 | 65,000.00 |

| | | | |
|---|---|---|---|
| 2 | 3' x 8' | 1 | 44,500.00 |
| 3 | 2' x 8' | 1 | 26,000.00 |
| 4 | 1 1/2 ' x 8' | 1 | 19,500.00 |
| 5 | 1' x 8' | 1 | 16,000.00 |
| 6 | 4' x 4' | 1 | 33,000.00 |
| 7 | 3' x 4' | 1 | 22,500.00 |
| 8 | 2' x 4' | 1 | 13,500.00 |
| 9 | 1 1/2' x 4' | 1 | 10,000.00 |
| 10 | 1' x 4' | 1 | 8,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 10 මැනුම් කටයුතු සඳහා මිල ගණන් කැඳවීම.

| No | Description | B.M.S.B. Karunaratne, Registered Licensed Surveyor, No.12A, Ambanwala, Welamboda | P. Gnanaprakasam, Registered Licensed Surveyor, No.10, Benedict Avenue, Bawwagama, Nawalapitiya |
|---|---|---|---|
| 1 | **Survey of Land - Areas Under 01 Acre**<br>1 st 10 perches | 16,000.00 | 15,000.00 |
| 2 | For each additional perch over 10 perches up to 40 perches | 350.00 | 300.00 |
| 3 | Balance area up to 1 acre | 300.00 | 250.00 |
| | | | |
| | **Survey of Lands Perimeter and Supply of Palans - Area over 01 Acre** | | |
| 1 | Charges for the 1 st acre or part | 36,000.00 | 35,000.00 |
| 2 | For the balance area for every additional 1/4 acre or part to 2 nd acre | 6,000.00 | 5,000.00 |
| 3 | For extent over 2 acre for every additional 1/4 acre or part | 5,000.00 | 4,000.00 |
| | | | |
| | **Contour Survey Plan Only** | | |
| 1 | For the 1 st acre or part | 52,000.00 | 50,000.00 |
| 2 | For the balance area for every additional 1/4 acre or part | 11,000.00 | 10,000.00 |
| 3 | For extent over 3 acres for every additional 1/4 acre or part | 8,500.00 | 7,500.00 |
| | | | |
| | **Road Survey** | | |
| 1 | For the 1 st 1/4 KM distance | 31,000.00 | 30,000.00 |
| 2 | For the every additional 1/4 km up to 1 st km | 21,000.00 | 20,000.00 |

| | | | |
|---|---|---|---|
| 3 | Distance over 1km | 61,000.00 | 60,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මැනුම් කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 2.15 ට පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව